# අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරුතුමන්ගේ විශේෂ මාධ්‍ය නිවේදනය

මුළු රටම කම්පනයට පත් කළ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සිදු වී වසර 2 කටත් වැඩි කාලයක් ගත වුවද එහි පිටුපස තිබුණු කුමන්ත්‍රණය රටට හෙළිදරව් කිරීමට තවම රජය අසමත් වී තිබීම රටේ අනාගත ආරක්ෂාව බරපතළ ලෙස අනතුරේ හෙළීමක් බව තේරුම් ගත් අපි අපේ ජාතික වගකීම ඉටු කරනු වස් මෙම ප්‍රහාරය පිළිබඳ සම්පූර්ණ සත්‍යය රටට හෙළි හෙළිදරව් කරන්නැයි ඉල්ලා පසුගිය ජූලි 13 වන දා ජනාධිපති තුමාට ලිපියක් යොමු කළ බව ඔබ කවුරුත් දන්නා කරුණකි. ඊට ජනාධිපතිතුමාගෙන් සාධනීය ප්‍රතිචාරයක් බලාපොරොත්තුවෙන් සිටි අපට දින 24 කට පසු පිළිතුරු ලිපිය ලෙස ලැබුණේ ජනාධිපති තුමාවත්, අඩුම තරමේ එතුමාගේ ලේකම් තුමා වත් අත්සන් කළ ලිපියක් නොව ජනාධිපති කාර්යාලයට සම්බන්ධ නීතිඥවරයෙකුගේ අත්සනින් නිකුත් කළ ඉතාම ලාමක පිළිතුරකි. මෙම ප්‍රහාරය පිළිබඳව ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ මෙන්ම ඉන් පරිබාහිර ඇතැම් අංශ වෙතින් අප ලද දත්තයන් ඔස්සේ අප නැගූ බරපතළ ප්‍රශ්න සම්බන්ධයෙන් රජය ගන්නට යන කිසිදු ක්‍රියාමාර්ගයක් ගැන හෝ ඒවා ගැන නිසියාකාර විමර්ශනයක් පිළිබඳ කිසිදු සඳහනක් නැති එම ලිපියේ අඩංගු වන්නේ හුදෙක් ජනාධිපති කොමිෂන් සභා අවසන් වාර්තාව එදා සිට මේ දක්වා එකිනෙකා අතට හුවමාරු වූ ආකාරය පිළිබඳ විස්තරයක් පමණි.

පාස්කු ඉරුදින ඛේදවාචකය සිදුවී මෙතරම් දීර්ඝ කාලයක් ගතවූ පසුත් මේ භයානක මිනීමැරුම සම්බන්ධයෙන් සත්‍යය සොයා ගැනීමට රජයට කිසිදු වුවමනාවක් නැති බවත්, කල් මරමින් එය යටගසා අත සෝදා ගැනීමට සැරසෙන බවත් මෙම උදාසීන ක්‍රියා පටිපාටියෙන් පැහැදිලි වේ. පාස්කු ප්‍රහාරයෙන් අපමණ දේශපාලන වාසි ලබා ගනිමින්, ප්‍රහාරය සැලසුම් කළ අය එක මාසයක් ඇතුලත රටට හෙළිකරන බවට ජනතාවට ප්‍රතිඥා දෙමින් බලයට පැමිණි රජය අද එම ප්‍රශ්නය හිතාමතා මඟහරිමින්, එම ප්‍රශ්නය නගන වාරයක් වාරයක් පාසා එය කෙසේ හෝ යට ගැසීමට, ජනතාවගේ අවධානය වෙනතක

යොමු කරන උපායශීලී වැඩ වැඩපිළිවෙලක නියැලී සිටින බව ප්‍රකාශ කරන්නට සිදුවීම ඛේදවාචකයකි.

බෝම්බය පිපිරෙන විට බලයේ සිටි රජයත්, බෝම්බයේ සුලමුල සොයා වරදකරුවන්ව නීතිය අබිමුවට ගෙන එනවා යැයි පොරොන්දු දෙමින් බලයට පැමිණි වත්මන් රජයත් සිය ජාතික වගකීම බරපතළ ලෙස පැහැර හරිමින් ජනතාවගේ ප්‍රශ්න සහ ගැටළු වලට අසංවේදී වෙමින් ඔවුන්ගේ දුක් කඳුළු සහ මළමිනී මතින් දේශපාලනය කරමින් සිටී. ජනතාවගේ දුක් කඳුළු සහ රුධිරය දේශපාලඥයින්ට වාසි සහගත කෙළි බිමකි. කෝවිඩ් 19 භයානක වසංගතය තුළ පවා රජය තමන්ට වාසි වන ආකාරයට සියල්ල හරවා ගන්නට පසුබට වුනේ නැත.

නිදහස ලැබීමෙන් පසු මේ රටේ සිදු වූ මිනීමැරුම්, අතුරුදහන් කිරීම්, දේශපාලන පලිගැනීම්, පැහැර ගෙන යාම් දෙස බැලූ විට කෙළවරක් නැති අපරාධ මාලාව පිටුපස බොහෝවිට තිබෙන්නේ දේශපාලන බල හස්තයයි. මේ එකදු අපරාධයක් සම්බන්ධයෙන්වත් වැරදිකරුවන් රටට හෙළිදරව් වුණේවත්, පත්කළ කොමිෂන් සභා වලින් ජනතාවට සත්‍යය දැනගන්නට ලැබුණේ වත් නැහැ. පාස්කු ඉරුදින සිදු වූ සමූල ඝාතනය සම්බන්ධයෙන් ද එසේ කිරීමට අප රටේ පාලකයින් සිතා සිටින බව පැහැදිලියි.

සියලු දේශපාලකයන්ට මම කියන්නේ ආගමික නායකයන් වශයෙන් අපට අයුක්තියට හිස නැමීමට පුළුවන්කමක් නැත. ජනතාවගේ අහිංසක ලේ ගැන අපට කැක්කුමක් ඇත. අප අදහන ආගමික ශාස්තෘවරුන් ඉදිරියේ නිරපරාදේ වැගුරු අහිංසකයන්ගේ ලේ වලට ගණන් දීමට අපි බැඳී සිටිමු. එම වගකීමෙන් ලිස්සා පැනයාම අපේ හෘදසාක්ෂියට අනුව අපට කිසිසේත්ම කළ නොහැකියි. බෞද්ධ වේවා, හින්දු වේවා, ඉස්ලාම් වේවා, කතෝලික ක්‍රිස්තියානි වේවා, අප රටේ වෙසෙන සෑම පුරවැසියෙක් ගැනම අපට යුතුකමක් තිබෙනවා. සහෝදර බැඳීමක්, වගකීමක් තිබෙනවා. එම නිසා ජාති ආගම් භේදවලින් තොරව පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාර මාලාව මුළු රටටම එක වගේ බලපෑ බව අමුතුවෙන් කිව යුතු නෑ. ඉන් ඝාතනයට ලක් වූ, තුවාල වූ, සදාකාලික අබ්බගාතයන් වූ අය අතර හැම ආගමකටම අයිති අය සිටිනවා. හැම භාෂාවක්ම කතා කරන අය ඉන්නවා. එබැවින් මුල සිටම අපේ ගෞරවණීය සංඝරත්නය ප්‍රධාන සියලු ආගමික නායකයින් සහෝදරත්වයෙන් යුතුව මනුෂ්‍යත්වයේ නාමයෙන් රටේ

සාමය සහ සහජීවනය සඳහා කැප වී පෙරට ආවා. ජනතාව වෙනුවෙන් සිය වගකීම් නොපිරිහෙලා ඉටු කළා. අපිව දිරිමත් කලා.

එහෙත් ඒ වගකීම් තවම අවසන් වී නැහැ. අපේ රට තවම සුරක්ෂිත නැහැ. ගිය සති අන්තයේ දී අපි සමාජ ජාලයේ දුටුවා බුද්ධි අංශ නිලධාරීන් අතර හුවමාරු වූ ලිපියක් ගැන. පැය 24 ක් ඇතුළත ISIS ප්‍රහාරයක් ආගමික ස්ථාන ඉලක්ක කර ගනිමින් සිදුවන බව එහි පැහැදිලිව සඳහන් වී තිබුණා. ඒ කියන්නේ අපේ රට තවමත් සුරක්ෂිත නෑ කියන එකයි. ඕනෑම වෙලාවක පාස්කු ඉරුදින සිදු වූ ප්‍රහාරය වැනි ප්‍රහාරවලට තවමත් ඉඩ තිබෙනවා. රට භීතියට, ත්‍රාසයට පත්කර අහිංසක ජනතාවගේ ලේ මතින් දේශපාලන වාසි ගන්න, හෙට වුනත් බෝම්බ පුපුරුවන්න සලස්වන්න ඕන කෙනෙකුට පුළුවන් තත්වයක් තවම රටේ තිබෙනවා. එම නිසා මේ ඝාතන සංස්කෘතිය පවත්වගෙන යන්න ඉඩ දෙන්න අපට පුළුවන් කමක් නෑ. පාස්කු ඉරුදින ඝාතනයට ලක්වූ අහිංසකයන්ගේ ජීවිත පූජාවෙන් මේ රට පාඩමක් ඉගෙනගත යුතුයි. සැබෑ ඝාතකයා හඳුනා ගත යුතුයි. රට ඇත්ත දැනගත යුතුයි. ඒ නිසා අපි යුක්තිය කියා බලාපොරොත්තු වෙන්නේ පලිගැනීම නොවේ. සත්‍යය කුමක් ද කියා දැනගැනීමයි. ඇත්ත දැන ගැනීමෙන් මෙවැනි අමානුෂික මිනිස් ඝාතන යළිත් මේ රටේ කිසි තැනක සිදුවීමට ඉඩ නොදීමයි. ඒකයි අපේ ඉලක්කය. අප ලිපියෙන් ඉදිරිපත් කළ ඇතැම් වැදගත් කරුණු ගැන සාධාරණ පරීක්ෂණයක් සිදුවන බවක් පෙනෙන්නේ නැහැ.

දේශපාලකයන්ට මේ ඝාතන සංස්කෘතිය නිමා කිරීමට උවමනාවක් නැති බව එයින් දැන් දැන් පෙරටත් වඩා පැහැදිලිව පෙනෙනවා. ඔවුන්ට අන්තවාදය ප්‍රයෝජනවත්. මිනිසුන්ගේ දුප්පත්කම ප්‍රයෝජනවත්. දුක් කඳුළු මතින්, ලෙඩ දුක් වසංගත මැදින්, සිය ආත්මාර්ථකාමී ගමන ඉදිරියට ගෙන යනවා. පාස්කු ප්‍රහාරය ඇතුළුව මේ රටේ මෑත ඉතිහාසයේ ඇති වූ සෑම ප්‍රශ්නයකටම රජය ක්‍රියා කරන විදිය බලන්න. ජනතාවගේ වේදනාවට කන් දෙනව ද? සංවේදී වෙනව ද? එක ප්‍රශ්නයක්වත් විසඳනවා ද? විසඳු එක ප්‍රශ්නයක් වත් නෑ. මහජනතාවගේ හඬට විවෘත නෑ. ඉතා දරදඬු, අසංවේදී, හිතුවක්කාර ගමනක් තුළ ප්‍රජාතන්ත්‍රවාදී වැඩ වැඩපිළිවෙළ දුර්වල වෙනවා අපි දකිනවා. කෝවිඩ් 19 විතරක් නොවෙයි ජනතාවට විවිධ පීඩාවන් එල්ල වෙමින් තිබෙනවා. ගොවි මහත්වරුන්ට, ධීවර ජනතාවට, ගුරුවරුන් හා දරුවන්ට, විශ්ව විද්‍යාල

සිසුන්ට, ජීවන වියදම, බඩගින්න, බොහෝ දෙනෙකුට බලපානවා. දිනෙන් දින තීරණ ගන්න හරියාකාර සම්බන්ධීකරණයක් නැති පාවී පාවී යන රටක් අද තිබෙන්නේ. යුක්ති සාධාරණත්වයට ඉඩක් නෑ. අපේ දීර්ඝ ලිපියට ලැබුණු ලිස්සායන සුළු පිළිතුරෙන් එය තව තවත් අපට පැහැදිලි වෙනවා. අපි ඒ පිළිතුර ප්‍රතික්ෂේප කරනවා. මේ වැඩ පිළිවෙල ප්‍රතික්ෂේප කරනවා. ඊට අපේ ප්‍රබල විරෝධය දක්වනවා.

මේ කෝවිඩ් වසංගත තත්ත්වය උත්සන්න වී ගෙන යන කාල වකවානුවක අපි ජනතාවගේ ජීවිත අනතුරේ දමන්න සූදානම් නෑ. එම නිසා මහ මග උද්ඝෝෂන කර අපේ විරෝධතාවය පෙන්වීම්ට අපට සාධාරණ බාධා තිබෙනවා. ඒ සීමා උල්ලංඝනය නොකර අපේ නිහඬ විරෝධතාවේ ප්‍රබල සංකේතයක් ලෙස අපි මේ මාසේ 21 වන සෙනසුරාදා අපේ ගෙවල් වල කළු කොඩි ඔසවනවා. අපේ ගෙවල් වල, වැඩ කරන ස්ථානවල, කාර්යාල වල, කඩ සාප්පුවල, අපේ රථ වාහනවල, කලු කොඩියක් දමා අපට අපේ වේදනාවත්, අප්‍රසාදයක් පලකරන්න පෞද්ගලිකව ඉදිරිපත් වෙන්න පුළුවන්කම තිබෙනවා. එම නිසා මේ අසාධාරණ වැඩපිළිවෙළට විරුද්ධව ඔබේ අප්‍රසාදය පළ කිරීමේ ප්‍රබල ක්‍රමයක් ලෙස ඔබේ ගෙදර කළු කොඩියක් දමන්න ඔබට පුළුවන්කම තිබෙනවා. මේ වසංගත තත්ත්වය යටතේ එවැනි විරෝධතා ව්‍යාපාරයකට සම්බන්ධ වීමෙන් කෝවිඩ් ව්‍යාප්තිය පාලනය කර ගැනීමේ වැඩපිළිවෙළට බාධාවක් ඇති වෙන්නේ නැහැ. කෝවිඩ් වසංගතය වගේම දරුණු මේ අනිත් වසංගතය එනම් රට වැසියාගේ දුකට වේදනාවට අසංවේදී රාජ්‍ය පාලන ක්‍රමයක් දේශපාලන අතපෙවීම් වලට සියල්ල යට කිරීමත් ජනතා හඬ මර්දනය කිරීමේ වැඩ පිළිවෙලත් අපි පරාජය කළ යුතු වෙනවා. එම නිසා ජාති හා ආගම් භේද නොබලා මේ විරෝධතාවයට අප සමග එක්වන්න කියා අපි ඔබ සියලු දෙනාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

2021 අගෝස්තු 13 වන දින
අගරදගුරු නිවසේ දී